ස.සේ.කො.චක්‍රලේඛ අංක 04/2022

මගේ අංකය: ස.සේ.කො.1/චක්‍රලේඛ/iv/වෙළම
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,
දෙවන මහල,
කුරුණෑගල.
2022.10. 10

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩලවල,
ගරු සභාපති/සාමාන්‍යාධිකාරී/කළමනාකරු.

**<u>සමුපකාර සමිති සේවකයින්ට රාජකාරී කටයුතු කිරීම සඳහා යතුරු පැදියෙන් යාමේ දී ඒ සඳහා ගාස්තු ගෙවීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2019.04.22 දිනැති ස.සේ.කො. 03/2019 චක්‍රලේඛය මේ මඟින් සංශෝධනය කරනු ලැබේ.

02. ඒ අනුව පහත කොන්දේසි වලට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලයේ / කාරක සභාවේ පූර්ව අනුමැතිය සහිතව රාජකාරී කටයුතු සඳහා යතුරු පැදි භාවිතා කරන සමුපකාර සේවකයින්ට කිලෝමීටර් එකක් (1Km) සඳහා රු:20.00 ක ගමන් වියදම් දීමනාවක් ගෙවීමට කොමිෂන් සභාව අනුමත කර ඇත.

I. වෙළඳ පොල ඉන්ධන මිල අඩුවීමේදී අදාල ගමන් වියදම් දීමනාවද, ඒ ආකාරයෙන් ම සංශෝධනය කිරීම.
II. ඒ ඒ සමිතිවල ධාරිතාවය , ක්ෂේත්‍ර කටයුතු වල ස්වභාවය පිළිබඳ සැළකිල්ලට ගෙන මසකට ගෙවිය හැකි ගමන් වියදම් දීමනාවේ උපරිමය සමිතිය විසින් තීරණය කිරීම.

03. මෙම චක්‍රලේඛය 2022.09.20 දින සිට ක්‍රියාත්මක වේ.

04. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ඇතිව බවද දැනුම් දෙමි.

කොමිෂන් සභා නියමය පරිදි .

එච්.එම්.පී.කේ.හේරත්
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ)

පිටපත්:

| | |
|---|---|
| 01.ප්‍රධාන ලේකම් - වයඹ පළාත | - කා.දැ.පි. |
| 02.ලේකම්, සමුපකාර සංවර්ධන වෙළඳ,ඉඩම්,විදුලිබල හා බලශක්ති,ක්‍රීඩා හා යෞවන කටයුතු සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) | - කා.දැ.පි |
| 03.සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්(වයඹ පළාත) | - දැ.ගැ.පි.-අ.ක.ස. |
| 04.සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු | - දැ.ගැ.පි.-අ.ක.ස. |
| 05.සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්-කුරුණෑගල/හලාවත/කුලියාපිටිය/මහව- | - දැ.ගැ.පි.අ.ක.ස |